සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 7 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | පැය / மணித்தியாலம் / Hours: 02 |

නම ...................................................................... විභාග අංකය ....................................................

**අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) බුදුරජාණන් වහන්සේ සත්සති ගත කිරීමේදී කළගුණ සැළකීමේ ආදර්ශය ලෝකයාට පෙන්වා දුන්නේ,

1. පළමු සතියේදී ය.
2. දෙවෙනි සතියේදීය.
3. තෙවන සතියේදීය.
4. සිවුවන සතියේ දීය.

(2) බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් සය වන සතිය ගත කළේ,

1. රුවන් ගෙයි ය.
2. මුචලින්ද නාග දරණය යටය.
3. අජපාල නුග රුක මුලය.
4. කිරිපලු රුක මුලය.

(3) බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකා ගමනය සිදුවූයේ,

1. බක් පොහෝ දිනකය.
2. වෙසක් පොහෝ දිනකය.
3. දුරුතු පොහෝ දිනකය.
4. පොසොන් පොහෝ දිනකය.

(4) බිම්බිසාර රජතුමා විසින් සිදු කළ, බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව වනුයේ,

1. වේළුවනාරාමයයි.
2. ජේතවනාරාමයයි.
3. පූර්වාරාමයයි.
4. නීග්‍රෝධාරාමයයි.

(5) නව අරහාදී බුදුගුණ ඇසුරින් බුදුගුණාලංකාරය රචනා කරන ලද්දේ,

1. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ය.
2. වීදාගම මහා මෛත්‍රෙය හිමි ය.
3.අලගියවන්න මුකවෙටි තුමාය.
4. වෑත්තෑවේ හිමි ය.

(6) බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව බුදුන් වහන්සේ ඉසිපතනය කරා වඩින අතරමගදී හමුවූයේ,

1. උපතිස්ස පිරිවැජියා ය.
2. යසකුල පුත්‍රයා ය.
3. උරුවේල කාශ්‍යප ය.
4. උපක ආජීවකයා ය.

(7) බුදුරජාණන් වහන්සේ , ආනන්ද හිමියන් සමඟ එක්ව උණුපැන් සකසා , වණවී තිබූ සිරුර සියතින්ම පිරිසිදු කොට ඇප උපස්ථාන කළේ ,

1. සුනීතට ය .
2. පූතිගත්තතිස්ස හිමිට ය.
3. සෝපාකට ය.
4. මට්ටකුණ්ඩලීට ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(8) මෛත්‍රිය වැඩීමෙන් ලැබෙන ආනිසංස ගණන වනුයේ,

1. එකොළහකි. 2. දොළහකි.

3. දහසකි. 4. විසි එකකි.

(9) බුදු සසුනේ අග්‍ර දායිකාව ලෙස හැඳින්වෙන්නේ,

1. ප්‍රජාපතී ගෝතමී ය. 2. යසෝදරාව ය .

3. විශාඛාව ය. 4.සුජාතාව ය.

(10) ලෝකයාට ධර්මය දේශනා කරන ලෙස බුදුරජාණන් වහන්සේට ඇරයුම් කළේ,

1.ශක්‍ර දෙවියන් ය. 2. බිම්බිසාර රජතුමා ය.

3. සටිකාර බ්‍රහ්මයා ය. 4. සහම්පතී මහා බ්‍රහ්මයා ය.

(11) බුදු රජාණන් වහන්සේගේ සරණ ලත් අයෙකි.

1.ආලවක 2. නාලාගිරි

3. සෝපාක 4. අංගුලිමාල

(12) "බුදුරජාණන් වහන්සේ දෙව් මිනිසුන්ගේ ශාස්තෘවරයා ය" , යන අදහස ඇතුළත් බුදුගුණ පාඨය වනුයේ,

1.සත්ථා දේවමනුස්සානං 2. ලෝකවිදූ

3. සම්මා සම්බුද්ධ 4. සුගත

(13) බුදුන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වූයේ ,

1. සැවැත්නුවර ජේතවනයේදී ය. 2. මගධයේ වේළුවනයේදී ය

3. කුසිනාරාවේ උපවර්තනයේදී ය. 4. බරණැස ඉසිපතනයේදී ය.

(14) බුදුරජාණන් වහන්සේ අනන්ත ලක්ඛන සූත්‍රය දේශනා කරන ලද්දේ,

1. පස්වග මහණුන්ට ය. 2. ජටිල සහෝදරයන්ට ය.

3. භද්‍රවග්ගිය කුමාරවරුන්ට ය. 4. යසකුල පුත්‍රයා ඇතුළු පිරිසට ය.

(15) බෞද්ධ උපදෙස් රැසක් අපට ලබා දෙන බෞද්ධයාගේ අත්පොත නම්වූ , "ධම්ම පදය" ඇතුලත් වන්නේ සූත්‍ර පිටකයේ,

1. දීඝ නිකායට ය. 2. මජ්ඣිම නිකායට ය.

3. අංගුත්තර නිකායට ය. 4. ඛුද්දක නිකායට ය.

(16) මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු උසස් ගුණාංගයකි,

1. ලද දෙයින් සතුටු නොවීම. 2. දක්ෂයෙකු නොවීම.

3. අනතිමානි බව 4. සන්සුන් ඉඳුරන් නැති බව.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(17) විශාඛාව සෝවාන් වන විට ඇගේ වයස ,

1. අවුරුදු හයකි. 2. අවුරුදු හතකි.

3. අවුරුදු නවයකි. 4. අවුරුදු දහයකි.

(18) “සතුරු මිතුරු සැමට යහපතක් වේවා” යි ප්‍රාර්ථනා කරන්නේ,

1. මෛත්‍රී භාවනාවෙනි. 2. බුද්ධානුස්සති භාවනාවෙනි.

3. ආනාපානසති භාවනාවෙනි. 4. මරණානුස්සති භාවනාවෙනි.

(19) සුදත්ත සිටුතුමා , අනේපිඬු සිටුතුමා යන නමින් හැඳින්වූයේ,

1. සැම දෙනාගේම සිත් දිනාගත් අයෙකු වූ නිසාය. 2. සැමටම ප්‍රිය මනාප අයෙකු වූ නිසාය.

3.අනාතයින් උදෙසා ආහාරපාන පරිත්‍යාග තළ නිසාය. 4. මිතුරන්ට කළණ මිතුරකු වූ නිසාය.

(20) විපතක් වූ විට බොහෝ දෙනා බුදුගුණ සිහිකිරීමට පෙළඹෙති. එමඟින් ඔවුන්ගේ,

1. ලැජ්ජාව දුරුවේ. 2. බිය දුරුවේ.

3. රාගය දුරුවේ. 4. මානය දුරුවේ.

(ල. 2 x 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

**පළමු ප්‍රශ්නය අනිවාර්යයි ලකුණු 20කි. 2,3,4,5,6,7,8 ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් හිමිවේ.**

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

**(01) ඔබ පන්ති කාමරයේ දී පළමු වාරයට නියමිත පාසල් පාදක ඇගයීමට අනුව සිදු කළ බිත්ති පුවත් පතට අදාළව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. ඔබ බිත්ති පුවත්පත සෑදීමට උපයෝගී කරගත් අමුද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
2. එය සෑදීමේදී ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න.
3. ඔබ බිත්ති පුවත්පතට යෙදූ නම කුමක්ද?
4. බිත්ති පුවත් පත නිර්මාණයේදී ඔබ මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න.
5. සිරිත් විරිත් යන වචන දෙකේ අරුත් දක්වන්න.
6. සිරිත් විරිත් පිළිබඳව හොඳින් කියවෙන ඇම්.ඇල්. සිල්වා ගුරුමුහන්දිරම් තුමා රචනා කළ ග්‍රන්ථය කුමක්ද?
7. පන්සලේදී අනුගමනය කළ යුතු සිරිත් විරිත් බොදු දරුවෙකු වශයෙන් ඔබ දැන ගත යුතුයි. ඉන් 2ක් ලියා දක්වන්න.
8. වැසිකිළි , කැසිකිළි භාවිතයේදී ද චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කිරිම ඉතා වැදගත්ය. එවන් චාරිත්‍ර වාරිත්‍ර 2ක් දක්වන්න.
9. ඉරුදින දහම් පාසලට යන බෝසත් දරුවෙකු ලෙස ඔබට වඩාත් ගැළපෙන ඇඳුම කුමක්ද?
10. සිරිත් විරිත් හරිහැටි දැනගෙන ඒ අනුව ජීවිතය හැඩගස්වා ගැනීමෙන් යහපත් පුද්ගලයෙක් වනු ඇත. මේ පිළිබඳව වැකි දෙකක් ලියා දක්වන්න.

(ලකුණු 2x10=20)

**(02) වෙසක් පුර පසළොස්වක පොහෝදා බුද්ධත්වයට පත් අප බුදු පියාණන් වහන්සේ සති හතක් බෝධීන් වහන්සේ ඇසුරු කරමින් වැඩ සිටියහ.**

1. සත් සතියේ, එක් සතියක් ගත කළ ස්ථානය නම් කර එහිදී සිදුවූ වැදගත් කාරණයක් දක්වන්න. (ලකුණු 2)
2. පස්වග තවුසන්ගෙන් තුන් දෙනෙකු නම් කරන්න. (ලකුණු 3)
3. ප්‍රථම රහත් භික්ෂූන් වහන්සේලා හැට නම අමතා බුදුරජාණන් වහන්සේ දුන් අනුශාසනය කෙටියෙන් දක්වන්න. (ලකුණු 5)

**(03) අසරණ වීම හා ලෙඩවීම ලොව සැමට පොදු ධර්මතාවයයි.**

1. බුදුරජාණන් වහන්සේ පිහිටවූ අසරණයින් දෙදෙනෙකුගේ නම් ලියන්න. (ලකුණු 2)
2. ගිලන් වූ අයෙකුට උපස්ථාන කරන අයෙකු තුළ තිබිය යුතු ගුණාංග 3ක් නම් කරන්න. (ලකුණු 3)
3. පාසල් දරුවෙකු වශයෙන් ඔබට, අසරණයින්ට පිහිටවිය හැකි අවස්ථා 5ක් කෙටියෙන් දක්වන්න. (ලකුණු5 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**(04) උතුම් බුදු ගුණ නිතර නිතර මෙනෙහි කරන්නේ නම් අප තුළ ශ්‍රද්ධාව වැඩි දියුණු වේ.**

1. එසේ බුදුගුණ මෙනෙහි කරමින් කරන භාවනාව කුමක්ද? (ලකුණු 2)

2. "ඉතිපිසෝ...... " පාඨයෙහි සඳහන් බුදුගුණ නවයකි. ඒවායින් 3ක් නම් කරන්න. (ලකුණු 3)

3. බුදුගුණ අලංකාරය නම් පද්‍යයෙන් බුදුගුණ නවය ඉතා මැනවින් විග්‍රහ කර ඇත. බුදුගුණාලංකාරයේ ඔබ කැමති කවියක් ඇසුරින් බුදුගුණයක් විස්තර කරන්න. (ලකුණු 5)

**(05) බෞද්ධයින් වැඩිපුරම භාවිතයට ගන්නා සූත්‍ර දේශනා කිහිපයක් පිරුවානා පොත් වහන්සේට ඇතුළත්ව**

**තිබේ. ඒවායින්ද තුන් සූත්‍රයට මුල් තැනක් ලැබේ.**

1. එම තුන් සූත්‍රයට අයත් සූත්‍ර දේශනා අතරින් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

2. මෛත්‍රී වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග රැසකි. ඒවායින් ගුණාංග 3ක් නම් කරන්න. (ලකුණු 3)

3. ශිෂ්‍යයෙකු ලෙස මෛත්‍රී භාවනාව පුරුදු පුහුණු කිරීමෙන් ඔබට ලබා ගත හැකි ප්‍රයෝජන 5ක් ලියන්න.

(ලකුණු 5)

**(06) ශ්‍රේෂ්ඨ පුද්ගල චරිත ඇසුරින් අපට ලබා ගත හැකි ආදර්ශ රැසකි.**

1. බුදු සසුනේ අග්‍ර දායකයා සහ අග්‍ර දායිකාව නම් කරන්න. (ලකුණු 2)

2. ධනංජය සිටුතුමා තම දියණියට යුග ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා වැදගත් උපදේශ 10ක් ලබා දුනි. ඉන් 3ක් ලියා දක්වන්න. (ලකුණු 3)

3. ඔබගේ චරිතය හැඩගස්වා ගැනීමට අග්‍ර දායක දායිකා චරිත දෙකෙන් ලබා ගත හැකි ගුණධර්ම 5ක් ලියන්න. (ලකුණු 5)

**(07) බුදුන් හා දහම් සරණ ගිය පළමු ( ද්වේවාචික ) උපාසකවරුන් දෙදෙනෙකි.**

1. එම දෙදෙනා නම් කරන්න. (ලකුණු 2)

2. උරුවෙල් දනව්වෙහි ජටිල සහෝදරයෝ තුන්දෙනෙක් වාසය කළහ.

   මෙම ජටිල සහෝදරයෝ කවුරුහුද? (ලකුණු3)

3. එම ජටිල සහෝදරයින් තිදෙනාට සිටි පිරිස වෙන වෙනම සංඛ්‍යා වශයෙන් දක්වන්න. (ලකුණු5)

**(08) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරා ගෙන වාක්‍ය 5ක් ලියන්න.**

1. මිගාරමාතා

2. සුදත්ත සිටුතුමා

3. අසරණයන්ට පිහිට වෙමු.

(ලකුණු 5x2)